// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1635/26 - 2010 ජනවාරි 07 වැනි බ්‍රහස්පතින්දා - 2010.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ තුන් වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II වැනි තීරුවෙහි සඳහන් ඉම් හා මායිම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින් ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 ජනවාරි මස 05 වැනි දින,
බත්තරමුල්ලේ, 'සෙත්සිරිපාය',
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

*පල්ලේපොල නාගරික සංවර්ධන ප්‍රදේශය*

*I වැනි තීරුව*

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ අංක (E 416) ඇහැලෙපොල අංක ( E 420 A) පල්ලෙපොල උතුර අංක (E 420 E) පල්ලෙපොල දකුණ අංක (421 D) කීනිගම අංක ( E 400 D) එකමුතුගම (කොටසක්) අංක ( E 421) පල්දෙනිය (කොටසක්) යන ග්‍රාම නිලධාරි කොට්ඨාස වලින් සමන්විත පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියා වූ II වැනි තීරුවෙහි විස්තර වන ඉම් සහ මායිම් වලින් යුක්ත මුළු මහත් ප්‍රදේශය.

*II වැනි තීරුව*

උතුරට : කොස්වත්ත මාර්ගයේ හා එකමුතුගම මාර්ගයේ මධ්‍ය රේඛාවන් ඡේදනය වන ලක්ෂයේ සිට එකමුතුගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මීටර 152 ක් දුරින් පිහිටි ලක්ෂයෙන් ආරම්භ වී එකමුතුගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ගලේවෙල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද එතැන් සිට ගලේවෙල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මීටර් 10ක් ඊසාන දෙසට වේවැල්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට වේවැල්තොට මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට හා නැගෙනහිර දෙසට ඕලගන්වත්ත අම්බොකුදෙන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට හා නැගෙනහිරට දෙසට ඕලගන්වත්ත

උපලේඛනය (සම්බන්ධිතයි )

පල්ලේපොල නාගරික සංවර්ධන ප්‍රදේශය (සම්බන්ධිතයි )

| I වැනි තීරුව | II වැනි තීරුව |
| --- | --- |
| | මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද, එතැන් සිට එකී මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගිණිකොන දෙසට පුස්සපිටිය ඔයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද ; |
| නැගෙනහිරට : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට ඇහැලෙපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 416) නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට , නිරිත දෙසට සහ දකුණු දෙසට කිනිගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 421 D) උතුරු මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නිරිත දෙසට හා නැගෙනහිර දෙසට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ නිරිත දෙසට, ගිණිකොණ දෙසට, දකුණු දෙසට සහ නිරිත දෙසට, පල්දෙනිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 421) දකුණු මායිම් හමුවන තෙක් ද ; |
| දකුණට : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට පල්දෙනිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය ( E 421) හරහා නිරිත දෙසට සෘජු රේඛාවක් ඔස්සේ වෙලගෙදර ඇල හා මාතලේ පල්ලේපොල මාර්ගය හමුවන ලක්ෂය දක්වා ද එතැන් සිට වෙලගෙදර ඇලේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දෙසට හා වයඹ දෙසට පුස්සපිටිය ඔයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ද ; |
| බටහිරට : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට පුස්සපිටිය ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දෙසට හා උතුරු දෙසට පල්ලෙපොල දකුණු ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 420 E) දකුණු මායිම හමුවන තෙක් ද, එතැන් සිට පල්ලෙපොල දකුණු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ( E 420 E) දකුණු මායිම ඔස්සේ නිරිත දෙසට හා බටහිර දෙසට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බටහිර මායිම හමුවන තෙක් ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටහිර මායිම ඔස්සේ ඊසාන දෙසට හා වයඹ දෙසට මාදිපොල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද එතැන් සිට පල්ලෙපොල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 420 A) බටහිර මායිම ඔස්සේ නිරිත දිසාවට පල්ලේපොල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ( E 420 A) දකුණු හා බටහිර මායිම් හමුවන තෙක් ද, එතැන් සිට පල්ලෙපොල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ( E 420 A) බටහිර මායිම ඔස්සේ උතුරු දෙසට, ඊසාන දෙසට, උතුරු දෙසට හා ඊසාන දෙසට, කොස්වත්ත මාර්ගයේ මධ්‍ය රේඛාව හා එකමුතුගම මාර්ගයේ මධ්‍ය රේඛාවන් ඡේදනය වන ලක්ෂය දක්වා ද, එතැන් සිට එකමුතුගම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ඊසාන දෙසට ආරම්භක ලක්ෂය හමුවන ස්ථානය දක්වා වූ ප්‍රදේශය. |

01-659

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.